{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

**11 - ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **කාලය :**

විෂයය :- ඉතිහාසය I I පත්‍රය - පිළිතුරු

පාසලේ නම :- ....................................................

ඇතුළත්වීමේ අංකය :- ....................................................

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 1 | 21 | 1 | 31 | 3 |
| 02 | 3 | 12 | 1 | 22 | 4 | 32 | 4 |
| 03 | 3 | 13 | 3 | 23 | 1 | 33 | 3 |
| 04 | 2 | 14 | 2 | 24 | 2 | 34 | 1 |
| 05 | 1 | 15 | 3 | 25 | 1 | 35 | 4 |
| 06 | 2 | 16 | 1 | 26 | 4 | 36 | 1 |
| 07 | 3 | 17 | 1 | 27 | 3 | 37 | 1 |
| 08 | 2 | 18 | 2 | 28 | 2 | 38 | 4 |
| 09 | 2 | 19 | 4 | 29 | 2 | 39 | 1 |
| 10 | 4 | 20 | 4 | 30 | 3 | 40 | 3 |

**විශේෂ උපදෙස් : එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 1x40=40**

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| 11 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : |
|---|---|---|

විෂයය :- ඉතිහාසය II පිළිතුරු

පාසලේ නම :- ....................................................

ඇතුළත්වීමේ අංකය :- ....................................................

## I කොටස

01. (අ)

I. ආදර්ශ ලංකා සිතියමේ ලකුණු කර ඇත.
II. ආදර්ශ ලෝක සිතියමේ ලකුණු කර ඇත.

(ආ)

A. කිතුල්ගල බෙලිලෙන

B. පළමු වන ජයබාහු රජතුමා

C. භාතිකාභය රජතුමා

D. එඩ්වඩ් බාන්ස් (ලකුණු 1 × 4 = 4යි)

II. (A)

1. දෙවැනි රාජසිංහ රජු

2. මහනුවර රාජධානිය

3. පෘතුගීසි/ ලන්දේසි

4. රොබට් නොක්ස් (ලකුණු 1 × 4 = 4යි)

(B)

I. 16 ලුවී රජු

II. බූර්බෝන්

III. ප්‍රංශ විප්ලවය

IV. ස්ටේට්ස් ජෙනරල් සභාව (ලකුණු 1 × 4 = 4යි)

## II කොටස

02.

I. මිනිහාගල්කන්ද, බූන්දල , පතිරාජවෙල , අලුගල්ගේ, උඩමලල (මින් 03ක් සඳහා ලකුණු 03යි)

II. A. බූන්දල

B. බටදොඹලෙන

C. උඩරංචාමඩම

D. ගොවියන් විසූ ගම් (ලකුණු 1 × 4 = 4යි)

III. පහතරට වියළි කලාපය - දඩයමින් හා තැන තැන ඇවිද යමින් ආහාරයට ගතහැකි ස්වභාවික දෑ එකතු කර ගැනීම.

- තලගොයා, මුගටියා, මීමින්නා, ගවරා..... යන සතුන් දඩයම්කර ආහාරයට ගැනීම.

පහතරට තෙත් කලාපය - ගස් බෙල්ලන් ආහාරයට ගැනීමට දැඩි රුචිකත්වයක් දැක්වීම. වල් දෙල්, කැලෑ කෙසෙල් වැනි ශාකමය ආහාර අනුභව කිරීම.

වෙරළබඩ කලාපය - කලපු බෙල්ලන් ආහාරයට ගැනීම. ලුණු භාවිතයට හුරුවී සිටීම.

(කරුණු 02 ට ලකුණු 2 යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV

I. පවුල් කිහිපයකින් සැදුම්ලත් ගමක් නිර්මාණය වීම හා පවුලේ ප්‍රධානියා ගෘහපති වීම.

II. ගමේ පාලනයට ගමික නම් ප්‍රධානියෙකු සිටීම.

III. දසගම් ඇත්තන් නමින් හැඳින් වූ ස්වාධීන අධිකරණ මණ්ඩලයක් පැවතීම.

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

03.

I. i. පාලන කටයුතු වලට එක් නිශ්චිත පාලකයෙකු නොසිටීම.

ii. වත්පොහොසත්කම් ඇති ප්‍රභුවරුන් විසින් පාලනය මෙහෙයවීම.

iii. පරුමක නම් වූ බලවත් ප්‍රාදේශීය පාලකයන් සිටීම. (ඔවුන් සෙල්ලිපි වල විවිධ නම් වලින් හැඳින්වේ)

iv. රජ හා රාජ්‍ය යන සංකල්පයන් දක්නට නොලැබීම.

v. විකේන්ද්‍රගත පාලනයක් පැවතීම.

vi. ගෘහපති, ගමික හා පරුමක යන පාලකයන් පාලන කටයුතු මෙහෙයවීම.

vii. ප්‍රාදේශීය පාලනයට කාන්තාවන් ද සම්බන්ධ වීම. (පරුමකලු)

(ලකුණු 1 × 4 = 4යි)

II. A. පෙරියපුලියංකුලම ලිපිය

B. බ්‍රාහ්මණයාගම ලිපිය

C. දුටුගැමුණු රජු

D. පළවන විජයබාහු රජු (ලකුණු 1 × 4= 4යි)

III. (i) පරුමකවරුන් ලෙස කටයුතු කළ මාමාවරුන් සමඟ සටන් කර එම ප්‍රදේශය අත්පත් කර ගැනීම.

(ii) අගනගර කේන්ද්‍ර කරගත් පාලනයක් ඇරඹීම.

(iii) දසවන රාජ වර්ෂය වන විට මුළු දිවයින පුරාම ග්‍රාම සීමා ලකුණු කිරීම.

(iv) ගාමිණී වැව, අභය වැව, ජය වැව යන වැව් ඉදිකිරීම.

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. (i) රටවැසියාට ආරක්ෂාව සැලසීම.

(ii) ආර්ථික වශයෙන් රට දියුණු කිරීම.

උදා:- කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, කර්මාන්ත.

(iii) රටවැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම.

(iv) ජනතාවගේ සමාජ සුභ සාධනය දියුණු කිරීම.

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

04.

I. (i) දුර්වල පාලකයන් බලයට පත්වීම.

(ii) රාජවංශ අතර ගැටුම් (කාලිංග හා පාණ්ඩ්‍ය)

(iii) ආර්ථික පරිහානිය

(iv) කාලිංග මාඝ ආක්‍රමණය (ලකුණු 1 × 3 = 3යි)

II. A. සුභ සෙන්පතියා

B. තුන්වන විජයබහු රජු

C. හතරවන පරාක්‍රමබාහු රජු

D. ඉබන් බතුතා (ලකුණු 1 × 4 = 4යි)

III. (i) අග නගරයට සමකාලීන බලවත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන තිබීම

උදා:- - ඇදිගම - පස්වන පරාක්‍රමබාහු

- රයිගම - අලකේෂ්වර

- යාපනය - ආර්ය චක්‍රවර්තී

(ii) මව් පාර්ෂවයට රාජත්වය හිමි වීම

(iii) දේශපාලන වශයෙන් බලවත් වූ ප්‍රභූ පවුල් දෙකක් දක්නට ලැබීම

උදා:- - අලගක්කෝණාර පවුල

- සේනාලංකාධිකාර පවුල

(iv) තුන්වන වික්‍රමබාහු රජුගේ දුර්වල පාලනය

(v) නිශ්ශංක අලගක්කෝණාර දේශපාලන වශයෙන් බලවත් වීම

(vi) චීන අධිරාජ්‍යයේ ආක්‍රමණය

උදා :- 1405, 1409, 1411 චෙංහෝ ගේ ආක්‍රමණ

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. (i) දේශපාලන වැදගත්කම

- ❖ අවසන් වරට රට එක්සේසත් කිරීම
  උදා :- -1449 සපුමල් කුමාරයා යවා යාපනයේ ආර්ය චක්‍රවර්තී පරාජය කිරීම.
  -1461 අම්බුලුගල කුමාරයා මඟින් ජෝතිය සිටාණන් විසින් ඇති කළ කැරැල්ල මර්ධනය කිරීම.
  - වන්නි පාලකයන් අවනත කර ගැනීම.
- ❖ 1442 අදිවීරරාම පටුන ආක්‍රමණය කිරීම.
- ❖ 1443 විජයනගර් අධිරාජ්‍යය ආක්‍රමණය කිරීම.

(ii) ආගමික හා සංස්කෘතික වැදගත්කම

- ❖ තම මව සිහි වීමට සුනේත්‍රා දේවී පිරිවෙන ඉදි කිරීම.
- ❖ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වලට අනුග්‍රහය ලබා දීම.
  උදා :- - කැරගල පද්මාවති පිරිවෙන.
  - රයිගම ශ්‍රී සනානන්ද පිරිවෙන
  - දෙව්නුවර ඉරුගල්කුලතිලක පිරිවෙන
- ❖ සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීම.

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

05.

I. කෝට්ටේ, රයිගම, සීතාවක (ලකුණු 1 × 3 = 3යි)

II. (i) රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම

(ii) වෙළෙඳ ආධිපත්‍ය ලබා ගැනීම

(iii) පෙරදිග තිබූ මුස්ලිම් ආධිපත්‍යය බිඳ දැමීම (ලකුණු 2 × 2 = 4යි)

III. (i) කෝට්ටේ රාජධානිය කොටස් වලට කැඩී යාම

(ii) මායාදුන්නේ ගේ හා පළවන රාජසිංහ රජුගේ රණ ශූරත්වය

(iii) ධර්මපාල රජු කතෝලික ආගම වැළඳගැනීම නිසා භික්ෂූන් වහන්සේලා හා ප්‍රභූවරු කෝට්ටේ අතහැර සීතාවකට යාම

(iv) දළදා වහන්සේ සීතාවකට හිමි වීම

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. (i) ස්වභාවික ආරක්ෂාව

උදා:- ගිරිදුර්ග, වන දුර්ග, ජල දුර්ග, පංකජ දුර්ග

(ii) රජවරුන්ගේ රණශූරත්වය

උදා:- - පළමු වන විමලධර්මසූරිය රජු
- සෙනරත් රජු
- දෙවන රාජසිංහ රජු

(iii) උඩරට රජුට ජනතා පක්ෂපාතීත්වයහිමි වීම

(iv) උඩරැටියන්ගේ සටන් උපක්‍රම

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

06.

I. (i) නව බදු වර්ග පැනවීම

(ii) මුදලින් බදු එකතු කර ගැනීම

(iii) අවුමිල්දාර් නම් බදු නිලධාරීන් බදු එකතු කිරීමට යෙදවීම

(iv) බදු එකතු කිරීම රේන්ද ක්‍රමයට වෙන්දේසියේ විකිණීම

(v) මදුරාසි බදු නිලධාරීන් වෙරළබඩ ජනතාව දැඩි දුෂ්කරතාවට පත් කරමින් බදු එකතු කිරීම

(ලකුණු 1 × 3 = 3යි)

II. (i) පරිපාලන කටයුතු දුෂ්කරතාවකින් තොරව කර ගැනීමට ඉංග්‍රීසීන්ට අවශ්‍ය වීම

(ii) කොළඹ හා ත්‍රිකුණාමලය අතර මුහුදු ගමන් දුෂ්කර වීම

(iii) ඉංග්‍රීසීන්ට උඩරට ට පිවිසීමේ දී කඩවත් වල දී විශාල බදු මුදලක් ගෙවීමට සිදු වීම

(iv) කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිම් සබඳතාවකට උඩරට හරහා මහා මාර්ගයක් ඉදි කිරීමට අවශ්‍ය වුවත් උඩරට රජු ඊට අවසර ලබා නොදීම වීම

(v) වෙරළබඩ හා උඩරට දේශ සීමාවේ හමුදාවන් දෙකක් නඩත්තු කිරීමට සිදු වීම

(vi) පහතරට ප්‍රදේශ වලට උඩරට රජුගේ හමුදාවගේ ආධාර ඇතිව කැරලි ඇති වීම

(ලකුණු 2 × 2 = 4යි)

III. (i) නිදහස අහිමි වීම හා රජෙකු නොමැති වීම නිසා ඇති වූ හිත් තැවුල

(ii) ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම

(iii) උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම (හජ්ජි මරික්කාර් සිද්ධිය)

(iv) 1815 උඩරට ගිවිසුමේ වගන්ති උල්ලංඝණය කිරීම

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. ආර්ථික වෙනස්කම්

(i) ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම

(ii) රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම

(iii) ශ්‍රමයට මූල්‍යමය වටිනාකමක් හිමි වීම

(iv) යටිතල පහසුකම් දියුණු කිරීම

(v) වතු බදු ක්‍රමය

(vi) බැංකු කටයුතු දියුණු වීම

(vii) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

(viii) වතු ආර්ථිකයට පදනම වැටීම

සමාජීය වෙනස්කම්

(i) ධනපති පංතියක් බිහිවීම

(ii) නිර්ධන පංතියක් බිහිවීම

(iii) බටහිර අධ්‍යාපන ක්‍රමය

(iv) ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත වීම

(මෙම වෙනස්කම් වලින් අවම වශයෙන් එක් උදාහරණයක් හෝ තිබිය යුතුයි.

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

07.

I. අග්‍රාණ්ඩුකාරවරයා, ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව, අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, අධිකරණ කටයුතු

(ලකුණු 1 × 3 = 3යි)

II. (A) එක්සත් ජාතික පක්ෂය (B) 1972 ව්‍යවස්ථාදායක සභාව

(C) ශ්‍රේෂ්ඨාධිකරණය (D) මහා බ්‍රිතාන්‍යය (ලකුණු 1 × 4 = 4යි)

III. (i) වියලි කලාපයේ ගොවි බිම් ඵලදායී ලෙස කෘෂිකර්මාන්තයට යොදවා ගැනීම

(ii) ඉහළ යන විදුලි ඉල්ලුම සපුරාලීමට ජලවිදුලි උත්පාදනය

(iii) ඉඩම් නොමැති අයට ඉඩම් ලබා දීම

(iv) නව රැකියා අවස්ථා බිහි කිරීම

(v) ගංවතුර පාලනය

(vi) මිරිදිය මසුන් බෝ කිරීම

(vii) ජනතාවගේ සුභ සාධන කටයුතු දියුණු කිරීම

(මින් කරුණු 02 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. (i) රජයේ පාසල් පිහිටුවීම

(ii) විෂයමාලා සංවර්ධනය හා ගුරු පුහුණු කටයුතු නවීකරණය වීම

(iii) විද්‍යාගාර පහසුකම් හා පාසල් පුස්තකාල පහසුකකම් දියුණු වීම

(iv) දිවා ආහාර, වෛද්‍ය හා දන්ත වෛද්‍ය පහසුකම් ඇති කිරීම

(v) නොමිලේ අධ්‍යාපනය ලබා දීම

(vi) වෘත්තීය අධ්‍යාපනය ලබා දීම

(vii) නව විශ්ව විද්‍යාල පිහිටුවීම (1978 පෙර)

(viii) විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත් කිරීම

(1978 පසු ලියා ඇති පිළිතුරු වැරදි පිළිතුරු සේ සලකන්න)

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

**III** කොටස

08.

I. (i) 1453 කොන්ස්තන්තිනෝපලය තුර්කීන්ට යටත් වීම

(ii) වෙළෙඳාමේ දියුණුව හා නව වෙළෙඳ පංතියක් බිහිවීම

(iii) බුද්ධි ප්‍රබෝධය

(iv) පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම (ලකුණු 1 × 3 = 3යි)

II. (i) පාප්තුමා ප්‍රධාන කොටගත් පල්ලියේ දූෂිත ක්‍රියා කලාපය

(ii) පූජකවරු ලෞකිකත්වයට නැඹුරු වීම

(iii) බුද්ධි ප්‍රබෝධයක් සමඟ ඇති වූ චින්තන ප්‍රබෝධය

(iv) පල්ලියේ දූෂිත ක්‍රියා විවේචනය කළ අය සිටීම

උදා:- ජෝන් වෛක්ලිෆ්

ජෝන් හස්

ඉරාස්මස්

මාටින් ලූතර් (ලකුණු 2 × 2 = 4යි)

III. (i) පුද්ගලයාගේ නමින් නිර්මාණ බිහි වීම

(ii) ආගමික මුහුණුවරින් බැහැර වී ලෞකික හා ස්වභාවිකත්වයට නැඹුරු වූ කලාවක් බිහි වීම

(iii) ලෞකික රසවින්දනයට යොමු වූ ධනවතුන් ගේ අනුග්‍රහය ලැබීම

(iv) විශිෂ්ට කලා නිර්මාණ බිහි වීම

උදා:- චිත්‍ර

ප්‍රතිමා

(v) ගොතික් කලා සම්ප්‍රදායෙන් බැහැර වී රෝම ගෘහ නිර්මාණාංග සහිත ගෘහ නිර්මාණ කලාවක් බිහි වීම

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි

IV. (i) පෘථිවි කේන්ද්‍රවාදය වෙනුවට සූර්ය කේන්ද්‍රවාදය ප්‍රචලිත වීම

(ii) නිකලස් කොපර්නිකස් - පෘථිවිය ගෝලකාර බව හා පෘථිවි භ්‍රමණය

(iii) ජොහැන්නස් කෙප්ලර් - ග්‍රහලෝක සෞරග්‍රහ මණ්ඩලය තුළ ඉලිප්සාකාව මගක ගමන් කරන බව

(iv) ගැලීගියෝ ගැලීලි - බ්‍රහස්පති උපග්‍රහයින්, චන්ද්‍ර ආවාට හා සූර්ය ලප
(දුරේක්ෂය සොයා ගැනීමත් සමඟ)

(v) අයිසැක් නිව්ටන් - ගුරුත්වාකර්ෂණ බලය

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි

09.

I. (i) ඇල්සාස්-ලොරේන් ප්‍රශ්නය

(ii) බිස්මාර්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය

(iii) දෙවන විලියම් කෛසර්ගේ ක්‍රියා කලාපය

(iv) යටත් විජිත සඳහා වූ තරඟය

(v) අවි තරඟය හා ජාතිවාදය

(vi) යුරෝපය පිළ් දෙකකට බෙදීම

(vii) බෝල්කන් අර්බුධය

(viii) සරයේවෝ සිද්ධිය (ලකුණු 1 × 3 = 3යි)

II. මිත්‍ර පිල - බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඉතාලිය, ග්‍රීසිය, රුමේනියාව, ඇමරිකා එක්සත් ජනපදය

මධ්‍යම බලවතුන් - ජර්මනිය, ඔස්ට්‍රියාව, හන්ගේරියාව, බල්ගේරියාව, තුර්කිය (ලකුණු 1 × 4 = 4යි)

- හිට්ලර්ගේ ක්‍රියා කලාපය

(i) වෛමාර් සමූහාණ්ඩුව විවේචනය කිරීම

(ii) මගේ සටන නමින් කෘතියක් රචනා කිරීම

(iii) 1933 ජර්මන් පාර්ලිමේන්තුවේ බලය අල්ලා ගැනීම

(iv) වොන් හින්ඩන්බර්ගේ මරණයෙන් පසු ජර්මන් ජනපති බවට පත්වීම

(v) එස්.එස් නම් රහස් හමුදාව හා ගෙස්ටාපෝ නම් රහස් පොලිසිය නිර්මාණය කිරීම

(vi) දුඹුරු කමිස හමුදාවක් නිර්මාණය කිරීම

(vii) ජර්මනියේ දේශපාලන පක්ෂ තහනම් කිරීම හා ජර්මනිය තුළ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අහිමි කිරීම

(viii) පැසිස්ට්වාදය ක්‍රියාත්මක කිරීම

(ix) යුදෙව්වන් හා කොමියුනිස්ට්වාදීන් වර්ධනය කිරීම

(x) 1934 ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

(xi) යුධමය වශයෙන් ජර්මනිය ශක්තිමත් කිරීම

(xii) රටවල් ආක්‍රමණය කිරීම

උදා:- පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, සුඩෙටන්ලන්තය, සාර් නිම්නය, ඔස්ට්‍රියාව

මුසෝලිනීගේ ක්‍රියා කලාපය

(i) 1922 පැසිස්ට් පක්ෂය හරහා ඉතාලියේ බලය ලබා ගැනීම

(ii) කළු කමිස හමුදාවක් නිර්මාණය කිරීම

(iii) පැසිස්ට්වාදය නම් දේශපාලන සංකල්පය ක්‍රියාත්මක කිරීම

(iv) 1936 දී ඇබිසීනියාව ආක්‍රමණය කිරීම

(v) ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

(vi) හිට්ලර් සමඟ එකතු වී පැසිස්ට්වාදය ව්‍යාප්ත කිරීම

දෙදෙනා පිළිබඳව අනිවාර්යෙන්ම තොරතුරු ඇතුළත්විය යුතුයි.

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි

IV. (i) මෙතෙක් ලොව ඇති වූ විනාශකාරීම යුද්ධය බවට පත් වීම

(ii) ප්‍රංශය හා බ්‍රිතාන්‍යයේ අධිරාජ්‍යවාදී සංකල්ප බිඳ වැටීම

(iii) බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සතුව පැවති යටත් විජිත නිදහස් වීම

(iv) ඇමරිකා එක්සත් ජනපදය හා රුසියාව ලෝක බලවතුන් වීම

(v) බල කඳවුරු දෙකක් නිර්මාණය වීම


(vi) නිරවි යුද්ධය

(vii) එක්සත් ජාතීන්ගේ සංගමය බිහිවීම


(viii) නොබැඳි ජාතියක් බිහි වීම

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි

(අ) 4 (i)




උපදෙස් :- 1. අනුරාධපුරය නගරය නිවැරදිව ලකුණු කර ඇත්නම් ලකුණු 1 කි.


ප්‍රංශය
කොන්ස්තන්තිනෝපලය
නාගසාකි
තායිවානය
සුමාත්‍රා
අප්‍රිකාව
Africa
ඉන්දියන් සාගරය
Indian Ocean
N